*සැ. යු.* - (i) 2015.04.24 වැනි දින පළ වූ අංක 1912 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,913 - 2015 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 228 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 228 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ විසිතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 22 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

227 – B 080943—302 (2015/04)

## වෙනත් පත්කිරීම් ආදිය

2015 අංක 87

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අංශ අතර මාරු කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් 2015 මාර්තු මස 14 වැනි දින සිට ජ්‍යෙෂ්ඨතාවයේ වෙනසක් නොමැතිව දක්වා ඇති අංශ වෙතින් විනයාරක්ෂක අංශය වෙත අංශ අතර මාරු කරන අතර ඔවුන්ගේ නව නිළය සහ නිල අංකයන් පහත සඳහන් පරිදි වේ.

නාවික සෙබළ අංශයේ සිට :

ලුතිනන් (විආ) හෙල් කුඹුරේ ගෙදර තුෂාර ප්‍රියන්ත කුමාර, එන්ආර්ආර් 2671, ශ්‍රීලංනාහ ;
ලුතිනන් (විආ) ජයසූරිය ආරච්චිලාගේ තාරක ගිහාන් ජයසූරිය, එන්ආර්ආර් 2497, ශ්‍රීලංනාහ ;

විධායක අංශයේ සිට :

ලුතිනන් (විආ) කොතලාවල ලියනගේ සම්පත් කුමාර, එන්ආර්ආර් 2661, ශ්‍රීලංනාහ ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එස්ජ්එම්ජේ පෙරේරා, ආර්ඩබ්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

කොළඹ දී ය.

04-883

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැංක් පීඑල්සී - නගර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2015 මාර්තු මස 06 වැනි දින සිට පවත්වන ලද හැටන් නැෂනල් බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් 2003 නොවැම්බර් මස 28 වැනි දින සහතික කළ අංක 2108 සහ 2005 දෙසැම්බර් මස 08 දින සහතික කළ අංක 2593, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් 2007 ජනවාරි මස 08 දින සහතික කළ අංක 3284 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් 2012 දෙසැම්බර් මස 06 දින සහතික කළ අංක 4596 දරන බැඳුම්කරයන් මගින් මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා කහඳ ගමගේ දයා ශාන්ත කහඳසුමිත්‍ර කරුණාරත්න උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පළවන උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සමග දෙවන උපලේඛනයේ විස්තර කරන ලද මාර්ග අයිති, හැටන් නැෂනල් බැංක් පීඑල්සී විසින් මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත උකස් කොට ඇති හෙයින් ද,

එසේ හෙයින් ඉහත කී කහඳ ගමගේ දයා ශාන්ත කහඳසුමිත්‍ර කරුණාරත්න ඉහත කී මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යථ හිමිකරු සහ පාලනය දරන තැනැත්තා වශයෙන් ද, තවද ඉහත කී කහඳ ගමගේ දයා ශාන්ත කහඳසුමිත්‍ර කරුණාරත්න මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ වශයෙන් එකී සමාගමේ පාලනය සහ කළමනාකරණය දරන තැනැත්තා වශයෙන් ද පොදුවේ සියලුම එකඟතාවයන් සහ සමාගම සමඟ එළඹි සියලුම ගනුදෙනු කහඳ ගමගේ දයා ශාන්ත කහඳසුමිත්‍ර කරුණාරත්න විසින් එළඹී හෙයින් ද, කහඳ ගමගේ දයා ශාන්ත කහඳසුමිත්‍ර කරුණාරත්න හැටන් නැෂනල් බැංක් පීඑල්සී විසින් මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකමෙහි සත්‍ය අර්ථලාභියා වශයෙන් සියලුම ණයට ගැනීම් ගෙවීම් පැහැර හැරීම් සහ ඉහත කී පරිදි ගෙවීම් සඳහා පවත්නා බැරකම් පිළිබඳව දැනීම සහිත වන හෙයින් ද,

මාලබේ ප්‍රොපටි ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කහඳ ගමගේ දයා ශාන්ත කහඳසුමිත්‍ර කරුණාරත්න යන අය අයිරා පහසුකම් මත රු. 7,67,65,139.64ක මුදලක් සහ කාලීන ණය පහසුකම් මත රු. 34,024,001.65ක මුදලක් ඇතුළුව සමස්තයක් වශයෙන් රු. 11,07,89,141.29ක මුදලක් හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත ගෙවීම් පැහැර හැර ඇති හෙයින් 2014 ඔක්තෝබර් මස 30 දින වන විට හැටන් නැෂනල් බැංක් පීඑල්සී වෙත ඉහත කී බැඳුම්කරයන් මත

රුපියල් එක්දහස් එකසිය හත්ලක්ෂ අසූනමදහස් එකසිය හතලිස් එකයි ශත විසිනමයක (රු. 11,07,89,141.29) අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 11,07,89,141.29ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ඔක්තෝබර් මස 31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වැඩිදුර පොළිය ද සමඟ ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2108, 2593, 3284 සහ 4596 දරන උසක් බැඳුම්කරයන් යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කොට ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩලස් කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කරගනී.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ හි පිහිටි සර් අර්නස් ද සිල්වා මාවතේ වරිපනම් අංක 11, දරන ලුලුවර්ත් සහ ඔලිම්පස් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. මැක් විසින් පිළියෙල කරන ලද 1950 අගෝස්තු 03 වැනි දින අංක 131 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ආනන්දගිරි ෆලවර් පාරෙන් ද, නැගෙනහිරට : පොදු පාරෙන් ද, දකුණට : ෆලවර් පාරේ වරිපනම් අංක 17ත් ද සහ බස්නාහිරට : ලොට් බී වලින් ද මායිම් වූ එකී අංක 131 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්හයයි දශම හතර (අ. 0, රූ. 0, පර්. 36.4) ක විශාලත්වයෙන් යුතු ඉඩම ඒ තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේ. මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඒ 856/286 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ හි පිහිටි ලුලුවර්ත් සහ ඔලිම්පස් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. මැක් විසින් පිළියෙල කරන ලද 1950 අගෝස්තු 03 වැනි දින අංක 131 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් සී (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ආනන්දගිරි ෆලවර් පාරෙන් ද, නැගෙනහිරට : ලොට් ඒ ද, දකුණට : ලොට් බී ද සහ බස්නාහිරට : ෆලවර් පාරෙන් ද මායිම් වූ එකී අංක 131 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතර (අ. 0, රූ. 0, පර්. 4) ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වේ. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඒ 856/243 යටතේ ලියාපදිංචි වී ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

04-892